සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	කාලය / நேரம் / Time
11	පැය 01යි

නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය - I

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- 1 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුරු තෝරා පිළිතුරු පත්‍රයේ (x) ලකුණකින් සටහන් කරන්න.

---


(01) ඊජිප්තුවේ පිරමීඩ අයත් වන්නේ කුමන රජ පරම්පරාවකටද?
1. මොහැන්ජෝදාරා 2. පාරාවෝ 3. විජයබාහු 4. හිට්ලර්


(02) සැතපුමට අඟලක් ලෙස ආනතිය පිහිටන සේ නිර්මාණය කර ඇති වාරි කර්මාන්තය වන්නේ,
1. යෝධ ඇල 2. ජය ගඟ 3. සුවස් ඇල 4. ZD ඇළ


(03) අත් කියත මුවහත් තැබිය යුතු උපකරණය හා මුවහත් කෝණය වන්නේ,
1. තුන්හුලන් පීර, 45^0 2. පැතලි පීර, 60^0 3. තුන්හුලන් පීර, 60^0 4. පැතලි පීර 45^0


(04) අවම ඝනකම ගඩොල් 1 ක් වනසේ නිර්මාණය කරන බැමි වර්ගය නම්,
1. බඩගල් බැම්මයි. 2. ඉංග්‍රිසි බැම්මයි. 3. ප්ලෙමිස් බැම්මයි. 4. ද්විත්ව ප්ලෙමිස් බැම්මයි.


(05) මෙහි A දෙසින් බැලුවිට පෙනෙන රූපය වන්නේ,




1.


2.


3.


4.


(06) සමපාද ත්‍රිකෝණයක පරිමිතිය දී ඇති විට ත්‍රිකෝණය ඇඳීමට නම්,
1. ආධාරක රේඛාව දෙකට බෙදිය යුතුය. 2. ආධාරක රේඛාව තුනට බෙදිය යුතුය.
3. පරිමිතිය තුනට බෙදිය යුතුය. 4. පරිමිතිය දෙකට බෙදිය යුතුය.

(07) ---------- මෙම රේඛාව වස්තුවක
1. මධ්‍ය අක්ෂය දැක්වීමට යොදා ගනී. 2. සමමිතික බව දැක්වීමට යොදා ගනී.
3. සැඟි දාර දැක්වීමට යොදා ගනී. 4. කඩ පෘෂ්ඨ දැක්වීම සඳහා යොදා ගනී.

(08) ඇලුමිණියම් භාවිතයෙන් නිර්මාණය කරන බිත්ති වෙන් කිරිමක් සඳහා කොටස් එකලස් කිරිමේ ක්‍රමයක් ලෙස යොදා නොගන්නේ,
1. අල්ලු භාවිතය 2. මිටියම් ඇණ භාවිතය
3. ඉස්කුරුප්පු ඇණ භාවිතය 4. පෑස්සිම

(09) වර්ග මීටර් 0.5 වර්ග පලයක් ඇති කඩදාසිය වන්නේ
1. A0 කඩදාසිය 2. A1 කඩදාසිය 3. A2 කඩදාසිය 4. A3 කඩදාසිය

Past Papers Wiki


(10) 

මෙහි අංක 6 කේන්ද්‍ර කර A දක්වා දුර අරය ලෙස ගෙන වෘත්තයක් ඇඳීමෙන්

1. සවිධි පංචාස්‍රය ඇඳිය හැක.
2. සවිධි දෘඩාස්‍රය ඇඳිය හැක.
3. සවිධි සප්තාස්‍රය ඇඳිය හැක.
4. ඉහත කිසිවක් ඇඳිය නො හැක.

(11) ජාතික වෘත්තිය සුදුසු කම් මට්ටම 5(NVQ Level 5) සමත් පුද්ගලයෙකු.

1. සැලසුම් කරුවෙකි
2. කළමනාකරුවෙකි
3. සුපිරික්ෂකවරයෙකි
4. ස්වාධීනව කටයුතු කල හැකි ශිල්පියෙකි

(12) 

මෙම රූපය


1. පිරමීඩයේ විකසනය වේ.
2. කේතුවේ විකසනය වේ.
3. චතුස්තලයේ විකසනය වේ.
4. සිලින්ඩරයේ විකසනය වේ.

(13) ගඩොල් නිෂ්පාදන ක්‍රියාවලිය අනුපිලිවෙලින් සඳහන් පිළිතුර තොරන්න.

1. පිලිස්සිම, පවනේ වියලීම, මැටි අනා පදම් කිරීම, ගඩොල හැඩගැන්වීම
2. මැටි අනා පදම් කිරිම, පවනේ වියලිම, ගඩොල හැඩගැන්වීම, පිලිස්සිම
3. මැටි අනා පදම් කිරිම, ගඩොල හැඩගැන්වීම, පවනේ වියලිම පිලිස්සිම
4. මැටි අනා පදම් කිරිම, පිලිස්සිම, ගඩොල හැඩගැන්වීම, පවනේ වියලීම

(14) පාද සහ කෝණ සියල්ල එකිනෙකට සමාන වන්නේ,

1. ත්‍රිකෝණය
2. සෘජුකෝණාස්‍රය
3. පංචාස්‍රය
4. සවිධි ෂඩාස්‍රය


(15) 

මෙම රූපයේ ABCD පිළිවෙලින් නම්කර ඇති පිළිතුර තෝරන්න.

1. විශ්කම්භය, අරය, කේන්ද්‍රික ඛණ්ඩය
2. ජ්‍යාය, විෂ්කම්භය, අරය, කේන්ද්‍රික ඛණ්ඩය
3. අරය, ජ්‍යාය, විශ්කම්භය, කේන්ද්‍රික ඛණ්ඩය
4. ජ්‍යාය, අරය, විශ්කම්භය, කේන්ද්‍රික ඛණ්ඩය

(16) කොන්ක්‍රීට් වල ද්‍රව්‍ය විසංගමනයකින් තොරව ඉහල සිට පහලට තැන්පත් කල හැකි උපරිම උස වන්නේ,

1. 1.5 m
2. 2.5 m
3. 3.5 m
4. 4.5 m


(17) 

රූපය මගින් නිරූපණය වන ජ්‍යාමිතික නිර්මාණය නම්,

1. AB සරල රේඛාව කොටස් වලට බෙදීමයි.
2. AB රේඛාව සමච්ඡේදනයයි.
3. AB සරල රේඛාව දික් කිරීමයි.
4. AB සරල රේඛාවට ස්පර්ශයක් ඇඳීමයි.

(18) ද්‍රව්‍යයක යාන්ත්‍රික ගුණාංගයක් නොවන්නේ,

1. දෘඩි බව
2. විලයනීයතාව
3. තන්‍යතාව
4. කාපාංකය

(19) 

1. $0.4m^2$
2. $0.5m^2$
3. $0.6m^2$
4. $0.7m^2$

(20) ද්‍රව්‍යක ඵංගුරතාවය නිසා සිදු වන්නේ,

1. යම් බලයක් දුන් විට එහා මෙහා චලනය වීමයි.
2. ගැටීමකදි කැඩී බිඳී වෙන් වීමයි.
3. තාපය ලබා දුන් පසු ද්‍රව බවට පත්වීමයි.
4. නොකැඩී, නොබැඳී පැවැතීමයි.

(21) සමාන්‍ය වායුගෝලීය තත්වය යටතේ පදම් කල දැවයක සුදුසු ජල අනුපාතය

1. 12% - 20%
2. 15% - 20%
3. 12% - 15%
4. 12% - 25%

(22) ශාකයක් වර්ධනයේදී පරිසර තත්වයන් මත ඇඹරීමට ලක් වීමෙන් හට ගන්නා දූව දෝෂයකි.

1. පලුද්ද 2. කොස්ස 3. මැලියම් නහර 4. ඵලය


(23) දූව හෝ ලෝහ කොටස් විවිධ කොණික හැඩ වලට කපා ගැනීමට විවිධ අවස්ථා වල අවශ්‍ය වේ. එවැනි අවස්ථා වල භාවිතයට ගන්නා සුදුසුම උපකරණය වන්නේ,

1. යකඩ කපන කියත 2. රවුම් කියත (Circular Saw) 3. රාමු කියත (Mitre Saw) 4. අත් කියත

(24) A සමාහාර වල ප්‍රමිතිය B මිශ්‍රණ අනුපාතය C සුසංහසනය D පදම් කිරීම යන කරුණු අතරින් ගුණාත්මක කොන්ක්‍රීටයක් නිර්මාණය සඳහා වැදගත් වන්නේ,

1. ABD පමණි 2. BCD පමණි 3. ACD පමණි 4. ABCD යන සියල්ලම

(25)



මෙම සමචතුරස්‍රයේ පාද හතරම ස්පර්ශ වන සේ නිර්මාණය කළ හැකි ජ්‍යාමිතික නිර්මාණය,

1. වෘත්තයක් වේ 2. ඉලිප්සයක් වේ 3. සමපාද ත්‍රිකෝණයක් වේ 4. අර්ධ වෘත්තයක් වේ.

(26) ජල නළ පද්ධතියක විශාල නලයක අතරමැද ස්ථානයකින් කුඩා නලයකට ජල සැපයුම ලබා දීමට,

1. ඌනිත කෙවෙනියක් අවශ්‍ය වේ. 2. ඌනිත T කෙවෙනියක් අවශ්‍ය වේ
3. සම්බන්ධක කෙවෙනියක් අවශ්‍ය වේ. 4. ඌනිත වැලමිට නැම්ම අවශ්‍ය වේ

(27) ගඩොල් වල දෝෂයක් නොවන්නේ,

1. අඩුවෙන් පිලිස්සීම 2. ඇඹරීම
3. වැඩියෙන් පිලිස්සීම 4. සෘජු දාර පිහිටීම

(28) සමාහර මැනීමට භාවිතා කරන ආමාන පෙට්ටියක ඝන මීටර් ප්‍රමාණය

1. 0.034 කි 2. 0.035 කි 3. 0.036 කි 4. 0.037 කි


(29) වැඩ කොටස් දෙකක් එකට හිර කර අල්ලා ගැනීමට භාවිතා කරන උපකරණයකි.

1. **G** කරාමය 2. අඩුමිටිය 3. දෙකොන යතුර 4. ඉස්කුරුප්පු නියන

(30) වර්තමානයේ විදුලි විදුම් යන්ත්‍රයේ කාර්ය අතීතයේදී ඉටුකල ආවුද උපකරණ පමනක් ඇති පිළිතුර වන්නේ,

1. අවගාරය , අත්විදුම් යන්ත්‍රය , ග්‍රයින්ඩරය 2. අවගාරය , ඇලිස්කටුව , රැවට් බුරුමය
3. අවගාරය , අත්විදුම් යන්ත්‍රය , රැවට් බුරුමය 4. අවගාරය , රැවට් බුරුමය , නියන් වර්ගය

(31) මෙම රූපයෙන් දැක්වෙන්නේ,



1. අණ්ඩාකාර හිස සහිත ඉස්කුරුප්පු ඇණයකි. 2. දඩු ඉස්කුරුප්පු ඇණයකි.
3. රවුම් හිස සහිත ඉස්කුරුප්පු ඇණයකි. 4. පැතලි හිස සහිත ඉස්කුරුප්පු ඇණයකි.

(32) වෘත්තයක් මත පිහිටි ලක්ෂයකට වෘත්ත කේන්ද්‍රයේ සිට ස්පර්ශක ලක්ෂයට රේඛාවන් ඇඳ වීම සැදෙන කෝණයේ අගය වන්නේ

1. 90^0 2. 60^0 3. 45^0 4. 30^0

(33) තද දූවයක් නොවන්නේ

1. බුරුත 2. තේක්ක 3. ගිණිසපු 4. කොහොඹ

(34) කේතුවක් එහි ඇල උසට සමාන්තරව ඡේදනය කල විට එහි මුහුණත් හැඩය

1. ඉලිප්සයකි. 2. බහුවලයකි 3. පරාවලයකි 4. වෘත්තයකි.

(35) ලී අලවන ස්වාභාවික මැලියම් වර්ගයකි.

1. මාංශ ජනක ධාතු මැලියම්
2. යුරියා ෆෝමැල්ගඩි හයිඩ්
3. පොලිවිනයිල් ඇසිටෙට්
4. රෙසිනෝල් ෆෝමැල්ගඩ්හයිඩ්

(36) ආවුද හා උපකරණ ගබඩා කිරීම සඳහා සුදුසුම ස්ථානය වන්නේ,

1. වැඩ මේසය මතය
2. ආවුද පෙට්ටියක් තුලය
3. අල්මාරියක් තුලය
4. සෙවනැලි පුවරුව තුලය

(37) පෙවුම් කම්පකය භාවිතා කරනුයේ,

1. ගෙබිම සකස් කිරීමටය
2. කොන්ක්‍රීට් පදම් කිරීමටය
3. කොන්ක්‍රීට් මිශ්‍ර කිරීමටය
4. කොන්ක්‍රීට් සුසංහසනය කිරීමටය

(38) යතුගැමේ පියවර අතර තුන්වැනි පියවර වන්නේ,

1. මතු පිට ගෑම
2. ගනකම ගෑම
3. හුලප ගෑම
4. පළල ගෑම

(39) කෝණාකාරව යෙදෙන මුට්ටුවකි.

1. තට්ටු මුට්ටුව
2. පුලුක්කු මුට්ටුව
3. පසක් ගිරි මුට්ටුව
4. කයිනෝක්කු මුට්ටුව

(40) ඉලුම් කැට යනු

1. බිත්ති බැඳීමට යොදා ගන්නා ගඩොලකි.
2. කුළුණු බැඳීමට යොදා ගන්නා ගඩොලකි.
3. රළු ගල් බැමි සඳහා යොදා ගන්නා ගඩොලකි.
4. ආරුක්කු බැඳීමට යොදා ගන්නා ගඩොලකි.

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province


අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	11	නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය - II	කාලය நேரம் Time	පැය 02යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

- පළමු වන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නයට ලකුණු 20ක් හිමිවන අතර, අනෙක් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමිවේ. ප්‍රශ්න පත්‍රයට මුළු ලකුණු 60කි.

(01) i. වස්තුවක සමාංශක ප්‍රක්ෂේපන පෙනුමක් පහත දැක්වේ.



1. A ඊතලය දෙසින් බලා ඉදිරි පෙනුමද
2. B ඊතලය දෙසින් බලා පැති පෙනුමද
3. C ඊතලය දෙසින් බලා සැලැස්මද

තෙවන කෝණ ඍජු ප්‍රක්ෂේපණ චිත්‍ර ඇඳීමේ මූලධර්මයට අනුව සම්පූර්ණ පරිමාණයට අඳින්න. සියලු මිනුම් මිලිලීටර් වලිනි. (ලකුණු 15)

ii. අරය 17mm වන වෘත්තයක කේන්ද්‍රයේ සිට 55mm දුරින් පිහිටි p නම් ලක්ෂයේ සිට වෘත්තය මත පිහිටි ලක්ෂයට ස්පර්ශකය අඳින්න. (ලකුණු 05)

(02) නිවාස ඉදිකිරීමේදී ප්‍රධාන වශයෙන් මැටි ගැඩොල් හෝ සිමෙන්ති ගඩොල් භාවිතා කරයි.

i. ඉංජිනේරු ගඩොලක ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුව දිග, පළල, උස කීයද? (ලකුණු 01)

ii. ගඩොල් බැමි සඳහා භාවිතා කරන ගඩොල් කැලි හයක් නම් කරන්න. (ලකුණු 05)

iii. ඉහත නම් කරන ලද ඒවායින් හතරක රූප සටහනක් අඳින්න (ලකුණු 04)

PAST PAPERS WIKI

(03) නිවසක මායිම් තාප්පයක් සකස් කිරීම සඳහා සිමෙන්ති ගඩොල් යොදා ගැනීමට තීරණය විය. මායිම් තාප්පයේ දිග 4m හා උස 1.5m වේ.

- සිමෙන්ති ගඩොලක ප්‍රමාණය, මිලිමීටර් 350x175x100 වේ.
- තාප්පයේ $1m^2$ සඳහා ගල් 16ක් අවශ්‍ය වේ.
- එක් සිමෙන්ති ගලක් රු.75 වේ.
- තාප්පය ඉදිකිරීමට වැලි කියුබ් 1/2 අවශ්‍ය වේ.
- වැලි කියුබ් එකක් රු.30000 වේ.
- තාප්පය ඉදිකිරීමට සිමෙන්ති 50kg බෑග් 5ක් අවශ්‍ය වේ.
- සිමෙන්ති 50kg බෑග් එකක් 1750 වේ.
- තාප්පය $1m^2$ ඉදි කිරීමට පුහුණු ශ්‍රමය රු.4000
- සම්පූර්ණ තාප්පය ඉදි කිරීමට යන මුළු වියදම සොයන්න.

(ලකුණු 10)

(04) ගොඩනැගිල්ලක දොර සහ ජනේල සුවිශේෂී අංගයක් වේ. මේ සඳහා ප්‍රධාන වශයෙන් දැව රාමු යොදා ගනු ලැබේ.

i. ජනෙල් රාමු සහ පියන් නිර්මාණයට දැව වෙනුවට යොදාගත හැකි ආදේශක මොනවාද? (ලකුණු 02)

ii. ජනෙල් රමුවකට පියනක් සවි කිරීමේදී යොදා ගන්නා සවිකුරු වර්ග හතරක් නම් කරන්න. (ලකුණු 04)

iii. ඉන් දෙකක රූප සටහනක් අඳින්න. (ලකුණු 04)

(05) පෙදරේරු කර්මාන්තයේ ප්‍රධාන අංග වන්නේ කොන්ක්‍රීට් ගඩොල් බැමි, කපලාරුව, පිගන් ගඩොල් ඇතිරීම ආදියයි. ඒ සඳහා භාවිතා කරන ආවුද හා උපකරණ වගුගත කරන්න.

අවුදය/උපකරණය	උපකරණයේ කාර්යය	පෙදරේරු අංගය
		ගඩොල් බැමි බැඳීම
		කපලාරු කිරීම
		කොන්ක්‍රීට් ඇතිරීම.
		පිගන්ගඩොල් ඇතිරීම
		තීන්ත ආලේපය

(ලකුණු 10)

(06) ඉදිකිරීම් සඳහා කොන්ක්‍රීට් යොදා ගන්නේ කොන්ක්‍රීට් වල ඇති සුවිශේෂී ගුණාංග බොහොමයක් නිසාය.

i. කෙන්ක්‍රීට් වල ඇති සුවිශේෂී ගුණාංග මොනවාද? (ලකුණු 04)

ii. කොන්ක්‍රීට් සමග වැරගැන්නුම් කම්බි එකතු කළ විට වැඩිදියුණු වන ගුණාංගය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

iii. පහත කාර්යයන් සඳහා භාවිතා කරන මිශ්‍රණ අනුපාත නම් කරන්න.

1.කොන්ක්‍රීට් කුලුණු/බාල්ක
2.ජලගබඩා ටැංකි
3.තනි කොන්ක්‍රීට්
4.අධික ශක්තිය අවශ්‍ය පෙර සවි කොන්ක්‍රීට් (ලකුණු 04)

(07) ශ්‍රී ලංකාව තුල ඇති ශාක මිනිස් අවශ්‍යතාවය සඳහා යොදා ගැනීමට දැව බවට පරිවර්තනය කරයි.

i. දැව කඳන් ලෙස තිබියදී දකිය හැකි දෝෂ දෙකක් නම් කර රූප සටහන් අඳින්න. (ලකුණු 04)

ii. දැව සංරක්ෂණය හා දැව පදම් කිරීම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. වහලයක යට ලීයක් එම දිගටම සපයා ගත නොහැකි අවස්ථාවක එම කාර්ය ඉටු කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 02)

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025


ශ්‍රේණිය தரம் Grade	11	නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය - I, II	පිළිතුරු පත්‍රය

I කොටස

01 - 2	11 - 3	21 - 3	31 - 2
02 - 1	12 - 2	22 - 2	32 - 1
03 - 3	13 - 3	23 - 3	33 - 3
04 - 2	14 - 4	24 - 4	34 - 3
05 - 4	15 - 2	25 - 1	35 - 1
06 - 2	16 - 1	26 - 2	36 - 4
07 - 3	17 - 2	27 - 4	37 - 4
08 - 4	18 - 4	28 - 2	38 - 2
09 - 2	19 - 3	29 - 1	39 - 3
10 - 2	20 - 2	30 - 3	40 - 4

II කොටස

01. i.



- A - ලකුණු 4
- මාන යෙදීමට
- තෙවන
- නම් කිරීමට

B - ලකුණු 4

C - ලකුණු 4

	ලකුණු 01
	ලකුණු 01
	ලකුණු 01
	එකතුව 15

ii.

- වෘත්තය ඇඳීමට — ලකුණු 01
- කේන්ද්‍රය බාහිර ලක්ෂය සමග යාකිරීම — ලකුණු 01
- රේඛාව සමච්ඡේදනයට — ලකුණු 01
- අර්ධ වෘත්තය ඇඳීම — ලකුණු 01
- ස්පර්ශකය ඇඳීම — ලකුණු 01

එකතුව 05

02. i. මිලිමීටර් 220x105x65 — ලකුණු 01

ii. ගඩොල් 1/4, ගඩොල් 1/2 ගඩොල් 3/4, මා බාන්දුව, පට්ටම් බාන්දුව, වටනාස්ගල, ආන බාන්දුව
හයක් ලියා ඇත්නම් ලකුණු 05 ද අඩුවන එකක් සඳහා එක බැගින් අඩු කරන්න — ලකුණු 05

iii. නිවැරදි රූප සඳහා 1 බැගින් 4යි — ලකුණු 04

එකතුව 10

03.
- තාප්පයේ වර්ගඵලය - 4mx1.5m =6m^2 — ලකුණු 02
- සිමෙන්තිගල් සඳහා වියදම - 16x6x75 =රු.7200 — ලකුණු 02
- වැලිසඳහා වියදම - 3000x1/2 =රු.15000 — ලකුණු 01
- සිමෙන්ති සඳහා - 5x1750 =රු.8750 — ලකුණු 02
- පුහුණු ශ්‍රමය - 6x4000 =රු.24000 — ලකුණු 01
- නුපුහුණු ශ්‍රමය - 6x2500 =රු.10000 — ලකුණු 01
- මුළු වියදම — එකතුව 10

04. i. ඇලුමිනියම්, ප්ලාස්ටික්, ෆයිබර් — 1x2 ලකුණු 02

ii. ජනෙල් මුදු, හුලං කොකු, කඳන් ලොක්, සරනේරු — 1x4 ලකුණු 04

iii. නිවැරදි රූප සටහන් දෙකකට — 2x2 ලකුණු 04

එකතුව 10

05. නිවැරදිව වගුව සම්පූර්ණ කර ඇත්නම් එක කොටසට ලකුණු 2 බැගින් — ලකුණු 10 යි

06. i. සම්පීඩන ශක්තිය, සුවිකාර්යතාවය, කල්පැවැත්ම දෙකක් ලියා ඇත්නම් ලකුණු 04

ii. ආතන්‍ය ප්‍රත්‍යා බලය පැහැදිලි කර ඇත්නම් ලකුණු 02යි

iii. නිවැරදි මිශ්‍රණ අනුපාත එකකට එක බැගින් ලකුණු 04යි

07. i. ඉරිමදය, පලුද්ද ඵලය නම් කිරීමට 1x2 ලකුණු 2 යි
රූපය 1x2 ලකුණු 2 යි

ii. නිවැරදි පැහැදිලි කිරීමට ලකුණු 4 යි

iii. දිග වැඩි කිරීමේ මුට්ටුවක් යොදා ගන්නා ආකාරය පැහැදිලි කිරීමට ලකුණු 2යි.

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank